නිපුණතාව 7.0 - මුදල් හා මිල මට්ටම්වල හැසිරීම හඳුනා ගනිමින් ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට බැංකු පද්ධතිය දායක වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 7.1 - මුදල්,මුදල් වර්ග හා මුදලේ කාර්යයන් විමසා බලයි.

මුදල් -

භාණ්ඩ හා සේවා හුවමාරු කිරීමේදී ගෙවීම් මාධ්‍යයක් වශයෙන් පොදුවේ පිළිගන්නා වූ ඕනෑම දෙයක් මුදල් වශයෙන් සලකනු ලැබේ.

හොඳ මුදලක දැකිය හැකි ලක්ෂණ

1.පොදු පිළිගැනීමක් තිබීම.
2.කල්පැවැත්ම
3.සමජාතීය බව
4.කුඩා කොටස්වලට බෙදිය හැකි වීම.
5.පහසුවෙන් එහා මෙහා ගෙන යාමට හැකි වීම.
6.වටිනාකම ස්ථාවරව පැවතීම.
7.නීත්‍යානුකූල වලංගුභාවය
8.සුලභ හෝ දුර්ලභ හෝ නොවීම.
9.අනුකරණය කළ නොහැකි වීම.
10.පහසුවෙන් හඳුනාගත හැකි වීම.

අභ්‍යාස

1.මුදලේ ප්‍රධාන කාර්යයන් හතර පැහැදිලි කරන්න.

2.වර්තමානයේ භාවිතා වන මුදල් වර්ග 5ක් නම් කර ඒවා කෙටියෙන් හඳුන්වන්න.

3.ණයපත් මුදල් ලෙස නොසැලකෙන්නේ ඇයි?